# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2019 නොවැම්බර් මස 15 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2019.11.19 දින නිකුත් කරන ලදී)**

### දේශීය ආදායම් (සංශෝධන)

**2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල් අමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 28.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ, සේවා නියුක්තියෙන් යම් පුද්ගලයකු ලබන ලැබීම් හා ලාභ ගණනය කිරීමේ දී, සේවායෝජකයකු විසින් පාරිතෝෂික අරමුදලකට ගෙවන ලද දායක මුදල් නිදහස් කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ආයෝජන දිරිගැන්වීම් සහ තාවකාලික සහන දෙනු ලැබිය හැකි ව්‍යාපාර වර්ග පුළුල් කිරීම වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, සේවායෝජකයා විසින් සේවානියුක්තයා වෙනුවෙන් ගෙවන ලද බද්ද අඩු කිරීම සඳහා ඉඩ ලබා නොදීම වේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය, පැහැදිලි කිරීමේ කාර්යය සඳහා සංශෝධනය කරනු ලැබේ.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය, පැහැදිලි කිරීමේ කාර්යය සඳහා සංශෝධනය කරනු ලැබේ.

***7 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ සමාගමක අඩු කරනු ලැබිය හැකි මූල්‍ය පිරිවැය නිශ්චිතව දැක්වීම වේ.

***8 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ආයෝජන වත්කමකින් වූ ලැබීමකින් යම් පාඩුවක් අඩු කිරීමට ඉඩ නොදීම වේ.

***9 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, භාරයකට හෝ සමාගමකට ස්වකීය තක්සේරු වර්ෂය වෙනස් කිරීමට හැකි වන පරිදි විධිවිධාන සැලැස්වීම වේ.

***10 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ නිශ්චිතව දක්වන ලද අතිරේක බද්දක් ගෙවීමට රාජ්‍ය නොවන සංවිධානයකට නියම කිරීම වේ.

***11 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය, පැහැදිලි කිරීමේ කාර්යය සඳහා සංශෝධනය කරනු ලැබේ.

***12 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය, පැහැදිලි කිරීමේ කාර්යය සඳහා සංශෝධනය කරනු ලැබේ.

***13 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ අදාළ ගෙවීම් සිදු කිරීම සනාථ කරමින් සහතිකයක් ඉදිරිපත් කරනු ලබන්නේ නම් සේවා ගාස්තු සහ කොන්ත්‍රාත් ගෙවීම්, රඳවා ගැනීමේ බදු බැඳියාවෙන් නිදහස් කිරීම වේ.

***14 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ බදු රඳවා ගනු ලැබීමට යටත්වන්නකු වෙත රඳවා ගැනීමේ සහතිකය භාර දෙනු ලැබිය යුතු කාලසීමාව දීර්ඝ කිරීම වේ.

***15 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය, පැහැදිලි කිරීමේ කාර්යය සඳහා සංශෝධනය කරනු ලැබේ.

*16 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ තොරතුරු වාර්තාවක් සහ වාර්ෂික වාර්තාවක් ගොනු කිරීමට තැනැත්තකුට නියම කිරීම වේ.

*17 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 139 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ තක්සේරුවකට එරෙහිව විරෝධතාවක් ඉදිරිපත් කිරීමේ දී වාර්තාවක් සහ වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කිරීමට නියම කිරීම වේ.

*18 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ "කෘෂිකාර්මික ව්‍යාපාරය" යන යෙදුමේ අර්ථ නිරූපනය පුළුල් කිරීම වේ.

*19 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ උපලේඛනයේ නීතිය බලපෑම වනුයේ-

(අ) අදාළ ආදායම් බදු බැදියාව මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ සහ විකිණීමේ හෝ ආනයනය කිරීමේ සහ විකිණීමේ නිරත ව්‍යාපාරවලට සීමා කිරීම; සහ

(ආ) රාජ්‍යභාග සම්බන්ධයෙන් බදු අනුපාතයක් නිශ්චිතව දැක්වීම,

වේ.

*20 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ උපලේඛනයේ නීතිය බලපෑම වනුයේ-

(අ) නව ව්‍යාපාරවල මෙන්ම පවත්නා ව්‍යාපාරයක් පුළුල් කිරීම සඳහා ආයෝජනය කරන තැනැත්තන්ට වැඩි කළ ප්‍රාග්ධන දීමනා ප්‍රදානය කිරීමට විධිවිධාන සැලසීම ; සහ

(ආ) ඇතැම් සේවානියුක්ති ආදායම් රඳවා ගැනීමේ බද්දෙන් නිදහස් කිරීමට විධිවිධාන සැලසීම,

වේ.

*21 වන වගන්තිය :* මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ උපලේඛනයේ නීතිය බලපෑම වනුයේ-

(අ) ළමයින්ට, වැඩිහිටියන්ට හෝ ආබාධිතයන්ට රැකවරණය සලසන පුණ්‍ය ආයතනවලට උපචිත වන හෝ ඒවා උපයන පොලිය;

(ආ) යම් තැනැත්තකුට ජනාධිපති අරමුදලින් හෝ ජාතික ආරක්ෂක අරමුදලින් හෝ යම් රාජ්‍ය සංස්ථාවකට ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජය හරහා සපයන යම් ණය මුදලකින් ලැබෙන යම් මුදලක් ;

(ඇ) යම් වාසික තැනැත්තකු හෝ නිර්වාසික තැනැත්තකු විසින් රජය විසින් හෝ රජය වෙනුවෙන් නිකුත් කරන ලද රාජ්‍ය බැඳුම්කර මත උපයන ලද ආදායම;

(ඈ) නිශ්චිතව දක්වන ලද අවස්ථානුගත තත්ත්වයන් යටතේ ඇතැම් වාසික සමාගම් ගෙවන ලද ලාභාංශ සහ නිශ්චිතව දක්වන ලද ව්‍යාපාරවල නිරත වෙනත් සමාගම් ගෙවන ලද ලාභාංශ,

මත බදු නිදහස් කිරීම ලබා දීම වේ.

***22 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ උපලේඛනයේ නීතිය බලපෑම වනුයේ සුදුසුකම් ලබන ගෙවීම් සහ සහනවල විෂය පථය පුළුල් කිරීම වේ.

***23 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි ඒ උපලේඛනයේ නීතිය බලපෑම වනුයේ තාවකාලික සහනවල විෂය පථය පුළුල් කිරීම වේ.

***24 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින්, ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද ඇතැම් සංශෝධන අතීතයට බලපාන පරිදි බලපැවැත්වීමට විධිවිධාන සලස්වනු ලැබේ.

## දේශීය ආදායම් (සංශෝධන)

එල්.ඩී.— ඕ. 19/2018

### 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය.*

1. මේ පනත 2019 අංක     දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.*

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 5 වන වගන්තියේ (3) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "සියලු පූර්ණ කාලීන" යන වචන වෙනුවට "අදාළ සේවයේ එකම ශ්‍රේණියේ සියලු පූර්ණ කාලීන" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ "අර්ථසාධක හෝ ඉතිරි කිරීමේ අරමුදලක හෝ අර්ථසාධක හෝ ඉතිරි කිරීමේ සමිතියක" යන වචන වෙනුවට "අර්ථසාධක, පාරිතෝෂික හෝ ඉතිරි කිරීමේ අරමුදලක හෝ ඉතිරි කිරීමේ සමිතියක" යන වචන ආදේශ කිරීමෙන්.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "මේ පනතේ දෙවන හෝ හතරවන උපලේඛනය මඟින්" යන වචන වෙනුවට "මේ පනතේ දෙවන, හතරවන හෝ හයවන උපලේඛනය මඟින්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (v) වන අනුඡේදයේ "අර්ථසාධක හෝ ඉතිරි කිරීමේ අරමුදලකට" යන වචන වෙනුවට "අර්ථසාධක, පාරිතෝෂික හෝ ඉතිරි කිරීමේ අරමුදලකට" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (ix) වන අනුඡේදයේ "දරන ලද වියදම්; හෝ" යන වචන වෙනුවට "දරන ලද වියදම්;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ ඡේදයේ (x) වන අනුඡේදයේ "බදු හෝ වෙනත් අය කිරීම්." යන වචන වෙනුවට "බදු හෝ වෙනත් අය කිරීම්; හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඈ) ඒ ඡේදයේ (x) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන්:-

"(xi) සේවානියුක්තයකු වෙනුවෙන් සේවායෝජකයකු විසින් ගෙවන ලද මුළු බදු මුදල් ප්‍රමාණය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "අවසර දී ඇති අවස්ථාවක," යන වචන වෙනුවට "අවසර දී ඇති අවස්ථාවක, ඒ බද්ද රඳවා ගනු නොලබන විටක දී හෝ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "(හතරවන උපලේඛනයේ 3 වන ඡේදය)." යන වචන සහ ඉලක්කම වෙනුවට "(හතරවන උපලේඛනයේ 3 වන ඡේදය)." යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "මේ පනතේ දෙවන හෝ හතරවන උපලේඛනයේ" යන වචන

වෙනුවට "මේ පනතේ දෙවන, හතරවන හෝ හයවන උපලේඛනයේ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ආ) මේ පනතේ දෙවන, හතරවන හෝ හයවන උපලේඛනයේ විධිවිධානවලට අනුකූලව ගණනය කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් අස්ථිත්වයක් ලබන ආදායම ගණනය කිරීමේ දී" යන වචන වෙනුවට "සමාගමක් ලබන ආදායම ගණනය කිරීමේ දී" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ (5) වන උපවගන්තියේ "වෙනත් ආයෝජන වත්කමක් බැහැර කිරීමේ දී සිදුවන යම් පාඩුවක් අඩු කරනු නොලැබිය යුතු ය." යන වචන වෙනුවට "යම් පාඩුවක් අඩු කරනු නොලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "එහි තක්සේරු වර්ෂය"යන වචන වෙනුවට "තක්සේරු වර්ෂයක් සංයුක්ත වන මාස දොළහක කාලසීමාව" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "යම් භාරයක හෝ සමාගමක තක්සේරු වර්ෂය" යන වචනවල සිට ඒ උපවගන්තිය අවසානය තෙක් ඇති සියලු වචන සහ ඉලක්කම් වෙනුවට "(2) වන උපවගන්තිය යටතේ අනුමතය ලත් වෙනස් කිරීමක් මඟින් එම භාරය හෝ සමාගම විසින් වාරික මඟින් සහ VIII වන පරිච්ඡේදය යටතේ තක්සේරු කිරීම් මත බද්ද ගෙවිය යුතු අවස්ථාව වෙනස් වීමේ ප්‍රතිඵලය ඇති නො වන්නේ ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "මුදල් මත සියයට තුනක අතිරේක බද්දක්" යන වචන වෙනුවට "මුදල් ප්‍රමාණයෙන් සියයට තුනක් මත වූ අතිරේක බද්දක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 70 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "69 වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "69 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "ගෙවන ලද පොළිය; හෝ" යන වචන වෙනුවට "ගෙවන ලද පොලිය;" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඇ) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත යටතේ ආර්ථික සේවා ගාස්තුව අය කරනු ලැබිය හැකි සේවා ගාස්තු හෝ කොන්ත්‍රාත් ගෙවීම් ගෙවනු ලැබ ඇති බවට ප්‍රතිග්‍රාහක තැනැත්තා විසින් සහතිකයක් ඉදිරිපත් කරනු ලබන, සේවා ගාස්තු ගෙවීම් හෝ කොන්ත්‍රාත් ගෙවීම්,".

ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය සංශෝධනය කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "එම වසරේ"යන වචන වෙනුවට "පසුව එළඹෙන වර්ෂයේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය සංශෝධනය කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ "84 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "84 වන වගන්තියේ (3)

වන උපවගන්තියේ (ආ) ඡේදය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "84 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "84 වන වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය සංශෝධනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තියේ "වෙනත් කාරණා පිළිබඳව තොරතුරු වාර්තා ගොනු කිරීමට නියම කරනු ලැබ ඇති පුද්ගලයකුට ද" යන වචන වෙනුවට "තොරතුරු වාර්තාවක් හෝ වාර්ෂික වාර්තාවක් ගොනු කිරීමට නියම කරනු ලැබ ඇති තැනැත්තකුට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 139 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 139 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(3) එම ඉල්ලීම, නියම කරන ලද වාර්තාවක් හෝ වාර්ෂික වාර්තාවක් නොමැතිව සාදනු ලැබූ තක්සේරුවකට එරෙහි විරෝධතාවක් වන අවස්ථාවක දී, විරෝධතාවට සම්බන්ධ ඉල්ලීම පිළිබඳ දැන්වීම අවස්ථාවෝචිත පරිදි, නිසිලෙස සැකසූ වාර්තාවක් හෝ වාර්ෂික වාර්තාවක් ද සමඟ යැවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ "කෘෂිකාර්මික ව්‍යාපාරය" යන යෙදුමේ අර්ථ නිරූපනය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපනය ආදේශ කිරීමෙන්:-

""කෘෂිකාර්මික ව්‍යාපාරය" යන්නෙන්, යම් කෘෂිකාර්මික නිෂ්පාදන, උද්‍යාන විද්‍යාත්මක නිෂිපාදන හෝ සත්ත්ව නිෂ්පාදන නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් අදහස් වන අතර, ඊට-

(අ) ඒ කෘෂිකාර්මික නිෂ්පාදන, උද්‍යාන විද්‍යාත්මක නිෂ්පාදන හෝ සත්ත්ව නිෂ්පාදන වෙළෙඳපොළට සුදානම් කිරීමේ කාර්යය සඳහා පිරිසිදු කිරීම, තේරීම, වර්ග කිරීම, ශ්‍රේණිගත කිරීම, ශීත කිරීම, වියළීම, ඇසුරුම් කිරීම, කැපීම හෝ ටින්වල ඇසිරීම සඳහා වූ ව්‍යවසායක්; සහ

(ආ) පශු සම්පත් හෝ කුකුළන් ඇති කිරීමේ කාර්යය සඳහා වූ ව්‍යවසායක්,

ඇතුළත් වේ;";

(2) "ලාභාංශ" යන යෙදුමේ අර්ථ නිරූපනයේ (අ) ඡේදයේ, " විකුණු කොටස් ආපසු ගැනීමක දී" යන වචන වෙනුවට "කොටස් ආපසු මිලදී ගැනීමක දී" යන වචන ආදේශ කිරීමෙන්.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (3) වන උපඡේදයේ-

(i) ඒ උපඡේදයේ "(2) වන උපඡේදයේ සඳහන්" යන වචන සහ ඉලක්කම වෙනුවට "(2) වන උපඡේදයේ (ආ) අයිතමයේ සඳහන්" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්;

(ii) ඒ උපඡේදයේ (ඇ) අයිතමයේ"ලැබූ මුදල් ප්‍රමාණ;" යන වචන වෙනුවට "ලැබූ මුදල් ප්‍රමාණ; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(iii) ඒ උපඡේදයේ (ඈ) සහ (ඉ) අයිතම ඉවත් කිරීමෙන්; සහ

(iv) ඒ උපඡේදයේ (ඊ) අයිතමය එහි (ඈ) අයිතමය ලෙස නැවත අක්ෂර යෙදීමෙන්;

(ආ) ඒ ඡේදයේ (4) වන උපඡේදයේ "මත්පැන් හෝ දුම්කොළ" යන වචන වෙනුවට "යම් මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනයක් නිෂ්පාදනය කිරීම සහ විකිණීම හෝ ආනයනය කිරීම සහ විකිණීම" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපලේඛනයේ 4 වන ඡේදයේ (3) වන උපඡේදයේ (iii) වන අයිතමයේ "දළ ආදායම මත" යන වචන වෙනුවට "ව්‍යාපාරයේ (ආයෝජන ආදායම හැර) දළ ආදායම මත" යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ උපලේඛනයේ 8 වන ඡේදයේ ශීර්ෂයේ "අර්ථසාධක හෝ විශ්‍රාම වැටුප්" යන වචන වෙනුවට "අර්ථසාධක, විශ්‍රාම වැටුප් හෝ පාරිතෝෂික අරමුදල්" යන වචන ආදේශ කිරීමෙන්;

(4) ඒ උපලේඛනයේ 10 වන ඡේදයේ (1) (ආ) උපඡේදයේ-

(අ) ඒ උපඡේදයේ (iii) වන අයිතමයේ "කුලියක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී - 10%; සහ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "කුලියක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී ඒ කුලිය මාසයකට රුපියල් 50,000 ක් හෝ තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් 500,000 ක් ඉක්ම වන්නේ නම් - 10%;"යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උප ඡේදයේ (iii) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය ඇතුළත් කිරීමෙන්:-

"(iv) වාසික තැනැත්තකුට ගෙවනු ලබන රාජ්‍ය භාගයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, ඒ ගෙවීම මාසයකට රුපියල් 50,000 ක් හෝ තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් 500,000 ක් ඉක්ම වන්නේ නම්- 14%; සහ"; සහ

(ඇ) ඒ උපඡේදයේ (iv) වන අයිතමය එහි (v) වන අයිතමය ලෙස නැවත අංකනය කිරීමෙන්.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ (1) වන උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන්:-

"(1) මේ ඡේදයට අනුව ගණනය කරනු ලබන වැඩි කළ ප්‍රාග්ධන දීමනා -

(අ) තක්සේරු වර්ෂයක් තුළ දී (පවත්නා ව්‍යාපාරයක් පුළුල් කිරීමක් නොවන) ආයෝජනයක් ශ්‍රී ලංකාව තුළ සිදු කරන තැනැත්තකුට, හතරවන උපලේඛනය යටතේ ගණනය කරනු ලබන ප්‍රාග්ධන දීමනාවලට අමතරව ප්‍රදානය කරනු ලැබිය යුතු ය;

(ආ) තක්සේරු වර්ෂයක් තුළ දී පවත්නා ව්‍යාපාරයක් පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ ආයෝජනයක් සිදු කරන තැනැත්තකුට, හතරවන උපලේඛනය යටතේ ගණනය කරනු ලබන ප්‍රාග්ධන දීමනා වෙනුවට ප්‍රදානය කරනු ලැබිය යුතු ය.".

(2) ඒ උපලේඛනයේ 3 වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"රඳවා ගැනීමේ බද්දෙන් සේවානියුක්ති ආදායම නිදහස් කිරීම-

3. ගෙවීම කරනු ලබන සමාගම ශ්‍රී ලංකාව තුළ අස්පෘශ්‍ය වත්කම් හැර ක්ෂය විය හැකි වත්කම් මත ඇ.ඩො. මිලියන 1,000 කට වඩා වැඩි වියදමක් දරා ඇත්නම් හෝ ඒ සමාගම 1 වන ඡේදයේ (5) වන උපඡේදය යටතේ වැඩි කළ ප්‍රාග්ධන දීමනාවකට හිමිකම් ලබයි නම් සහ ඒ ගෙවීම මේ උපලේඛනය යටතේ වූ වැඩි කළ ප්‍රාග්ධන දීමනා මගින් ආරක්ෂාව සලසන ලද ලාභ මගින් ගෙවනු ලැබ ඇත්නම්, තම රටින් බැහැරව වසන සේවානියුක්තයන් සංඛ්‍යාව විස්ස නොඉක්මවන අවස්ථාවක, පළමුවන උපලේඛනයේ කිසිවක් නොසලකා, සේවායෝජකයකු විසින් තම රටින් බැහැරව වසන සේවානියුක්තයකු වෙත සිදු කරනු ලබන ගෙවීමකින් රඳවා ගනු ලබන බදු අනුපාතය ශුන්‍ය විය යුතු ය.".

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම.

(1) ඒ උපලේඛනයේ (අ) ඡේදයේ (vii) වන උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"එසේ වුව ද, මේ ඡේදය යටතේ වූ නිදහස් කිරීම-

(i) (i) වන උපඡේදයේ සහ (ii) වන උපඡේදයේ නිශ්චිතව සඳහන් ආයතන නොවන යම් ආයතනයක ලාභාංශවලින් හෝ පොලියෙන් වූ ලැබීම්වලට සහ ලාභවලට; සහ

(ii) (i) වන උපඡේදයේ සහ (ii) වන උපඡේදයේ නිශ්චිතව සඳහන් ආයතන සම්බන්ධයෙන් වන විට, 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (xi) වන අනුඡේදය යටතේ ඉඩ දෙනු නො ලබන යම් මුදල් ප්‍රමාණයකට,

අදාළ කර ගනු නො ලැබිය යුතු ය;";

(2) ඒ උපලේඛනයේ (ඇ) ඡේදයේ (ii) වන උපඡේදයේ "අර්ථසාධක අරමුදලකින්,"යන වචන වෙනුවට " අර්ථසාධක අරමුදලකින් හෝ නියාමනය කරන ලද අර්ථසාධක අරමුදලකින්," යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ උපලේඛනයේ (එ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(එ) (i) පුණ්‍ය ආයතනයකට උපචිත වන හෝ එය විසින් උපයනු ලබන පොලිය එම පුණ්‍ය ආයතනය විසින් නඩත්තු කරනු ලබන නිවාසයක සිටින ළමයින්ට, වැඩිහිටියන්ට හෝ ආබාධිතයන්ට රැකවරණය සැලසීමේ කාර්යය සඳහා ම පමණක් යොදවන බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන අයුරින් සනාථ

කරන අවස්ථාවක දී, එම පුණ්‍ය ආයතනයට උපචිත වන හෝ එම පුණ්‍ය ආයතනය විසින් උපයනු ලබන පොලිය;

(ii) ශ්‍රී ලංකාවෙන් පිටත යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ පිහිටි එහි පාලක සමාගම වෙත හෝ පාලිත සමාගමක් වෙත ප්‍රදානය කළ යම් ණය මුදලක් නොවන, ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකු වෙත හෝ ශ්‍රී ලංකා රජය වෙත ප්‍රදානය කළ යම් ණය මුදලක් මත ඒ තැනැත්තාට උපචිත වන හෝ ඒ තැනැත්තා උපයන පොලිය;

(iii) යම් තැනැත්තකු විසින් හෝ යම් තැනැත්තකු වෙනුවෙන්, ශ්‍රී ලංකාවේ මහ බැංකුවේ අනුමතය ඇතිව, යම් වාණිජ බැංකුවක හෝ යම් විශේෂිත බැංකුවක විවෘත කරන ලද යම් විදේශීය ව්‍යවහාර මුදල් ගිණුමක විදේශීය ව්‍යවහාර මුදල්වලින් ඒ තැනැත්තාගේ බැරට පවතින මුදල් මත ඒ තැනැත්තාට උපචිත වන හෝ ඒ තැනැත්තා උපයන පොලිය, 2019 ජූලි මස 1 වන දිනයෙන් ආරම්භ වන වර්ෂ පහක කාලසීමාවක් සඳහා;

(iv) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වූ ද, ශ්‍රී ලංකාවේ වාසික වූ ද සහ තක්සේරු වර්ෂයේ පළමුවන දිනයට වයස අවුරුදු 18 ට අඩු වූ ද යම් ළමයකුට, මහජනතාවගෙන් තැන්පතු භාර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය දෙන ලද යම් මූල්‍ය ආයතනයක හෝ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ අර්ථානුකූලව වූ යම් ලියාපදිංචි කළ සමිතියක පවත්වාගෙන යනු ලබන යම් තැන්පතුවක් මත, මාසයකට රුපියල් පන්දහසක් දක්වා උපචිත වන හෝ ඒ ළමයා උපයන පොලිය;";

(4) ඒ උපලේඛනයේ (ඔ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඔ) (i) 1978 අංක 7 දරන ජනාධිපති අරමුදල් පනත මඟින් ස්ථාපිත කරන ලද ජනාධිපති අරමුදලින් හෝ 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනත මඟින් ස්ථාපිත කරන ලද ජාතික ආරක්ෂක අරමුදලින් යම් තැනැත්තකුට ලැබෙන;

(ii) පාර්ලිමේන්තුව විසින් ඒකාබද්ධ අරමුදලෙන් වෙන් කරන ලද අරමුදල්වලින් හෝ රජය හරහා සපයන ලද යම් ණය මුදලකින් යම් රාජ්‍ය සංස්ථාවකට ලැබෙන,

යම් මුදලක්;";

(5) ඒ උපලේඛනයේ (ඕ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඕ) (i) ශ්‍රී ලංකා රජය මඟින් හෝ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් නිකුත් කරන ලද, දේශීය හෝ විදේශීය ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද, යම් රාජ්‍ය බැඳුම්කරයක් මත වන පොලිය, වට්ටම හෝ යම් ලැබීමක් උපලබ්ධි කිරීම වශයෙන් ශ්‍රී ලංකාවේ ස්ථිර ආයතනයක් නොවන යම් නිර්වාසික තැනැත්තකු විසින් උපයන;

(ii) ශ්‍රී ලංකා රජය මඟින් හෝ ශ්‍රී ලංකා රජය වෙනුවෙන් නිකුත් කරන ලද, විදේශීය ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ද ඇතුළුව යම් රාජ්‍ය බැඳුම්කරයක් මත, අවස්ථාවෝචිත පරිදි, ගෙවන ලද හෝ ඉඩ දෙන ලද පොලිය හෝ වට්ටම වශයෙන් යම් වාසික තැනැත්තකු විසින් උපයන,

යම් ආදායමක්;";

(6) ඒ උපලේඛනයේ (ච) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ච) (i) වාසික සමාගමක් විසින් හෝ 84 වන වගන්තිය යටතේ රඳවා ගැනීමකට යටත් වන වෙනත් වාසික සමාගමක් විසින් ලද වෙනත් ලාභාංශයකට ආරෝපණය කළ හැකි තාක් දුරට හෝ ව්‍යුත්පන්න වන ප්‍රමාණයට, වාසික සමාගමක් විසින් සාමාජිකයකුට ගෙවනු ලබන ලාභාංශයක්;

(ii) 2012 අංක 12 දරන මුදල් පනතේ IV වන කොටසේ විධිවිධාන අනුව පහත දැක්වෙන යම් ව්‍යාපාරයක හෝ ව්‍යාපාරවල නිරත වන සහ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ ඇති යම් සමාගමක් විසින් ගෙවනු ලබන ලාභාංශයක්:-

(iiඅ) ආනයනය කිරීම, සුලු වශයෙන් පිරිසැකසුම් කිරීම සහ ප්‍රතිඅපනයනය කිරීම හා සම්බන්ධිත යම් ව්‍යාපාර කේන්ද්‍රීය මෙහෙයුම්;

(iiආ) එක් රටකින් භාණ්ඩ ප්‍රසම්පාදනය කර හෝ එක් රටක භාණ්ඩ නිෂ්පාදනය කර එම භාණ්ඩ ශ්‍රී ලංකාවට ගෙන ඒමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කිරීමේ අක් වෙරළ ව්‍යාපාර;

(iiඇ) විදේශයන්හි සේවාදායකයන් සඳහා අභිමුඛ සේවා සැපයීම;

(iiඈ) මූල්‍ය සැපයුම් ජාලය සහ බිල්පත් මෙහෙයුම් කටයුතු කළමනාකරණය සඳහා ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන්ගේ ප්‍රධාන කාර්යාලයීය මෙහෙයුම් කටයුතු සිදු කිරීම;

(ivඉ) ශ්‍රී ලංකාව තුළ බන්ධිත ගුදම් හෝ බහු පාර්ශ්වීය ඒකාබද්ධ කිරීම් ඇතුළු කාර්ය සම්පාදන සේවා සිදු කිරීම;".

ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (අ) උපඡේදයේ (iiඅ) අයිතමයේ "බදු අය කළ හැකි ආදායමෙන්" යන වචන වෙනුවට "තක්සේරු කළ හැකි ආදායමෙන්" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (අ) උපඡේදයේ (iiආ) අයිතමයේ "බදු අය කළ හැකි ආදායමෙන්" යන වචන වෙනුවට "තක්සේරු කළ හැකි ආදායමෙන්" යන වචන ආදේශ කිරීමෙන්;

(ඇ) ඒ ඡේදයේ (ඇ) උපඡේදයේ "1978 අංක 7 දරන ජනාධිපති අරමුදල් පනත මගින් පිහිටුවන ලද ජනාධිපති අරමුදලට ප්‍රේෂණය කරන ලද ලාභ." යන වචන සහ ඉලක්කම් වෙනුවට "ඒකාබද්ධ අරමුදලට හෝ 1978 අංක 7 දරන ජනාධිපති අරමුදල් පනත මගින් පිහිටුවන ලද ජනාධිපති අරමුදලට ගෙවන ලද යම් මුදලක්." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ උපලේඛනයේ 2 වන ඡේදයේ (ඉ) උපඡේදයේ "විදේශ ව්‍යවහාර මුදලින් උපයන" යන වචන වෙනුවට "විදේශ ව්‍යවහාර මුදලින් උපයන සහ බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනය සංශෝධනය කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ (1) වන උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන්:-

"(1) මේ ඡේදයට අනුව ගණනය කරනු ලබන, (4) වන උපඡේදයේ සඳහන් ක්ෂය විය හැකි වත්කම් මත වන වැඩි කළ ප්‍රාග්ධන දීමනා-

(අ) තක්සේරු වර්ෂයක් තුළ දී (පවත්නා ව්‍යාපාරයක් පුළුල් කිරීමක් නොවන) ආයෝජනයක් ශ්‍රී ලංකාව තුළ සිදු කරන තැනැත්තකුට, හතරවන උපලේඛනය යටතේ ගණනය කරනු ලබන ප්‍රාග්ධන දීමනාවලට අමතරව;

(ආ) තක්සේරු වර්ෂයක් තුළ දී පවත්නා ව්‍යාපාරයක් පුළුල් කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ ආයෝජනයක් සිදු කරන තැනැත්තකුට, හතරවන උපලේඛනය යටතේ ගණනය කරනු ලබන ප්‍රාග්ධන දීමනා වෙනුවට,

ප්‍රදානය කරනු ලැබිය යුතු ය.";

(2) ඒ උපලේඛනයේ 5 වන ඡේදයේ (1) වන උපඡේදයේ-

(අ) ඒ උපඡේදයේ (අ) අයිතමයේ "අවස්ථාවක දී;" යන වචන වෙනුවට "අවස්ථාවක දී; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපඡේදයේ (ආ) අයිතමය ඉවත් කිරීමෙන්; සහ

(ඇ) ඒ උපඡේදයේ (ඇ) අයිතමය එහි (ආ) අයිතමය ලෙස නැවත අක්ෂර යෙදීමෙන්.

අතීතයට බලපෑම.

**24.** මේ පනතේ 9 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට සිදු කරන ලද සංශෝධන සහ මේ පනතේ 21 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයේ (එ) (ii) ඡේදයට සහ (ඕ) ඡේදයට සිදු කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා 2018 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මකභාවයට පත්ව ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**25.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.